**ශීර්ෂය 308 - තැපැල් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 308 - තැපැල් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තැපැල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018අංක 19දරන ජාතික විගණන පනතේ 38වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් ලැබීම්**

-----------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | දෙපාර්තමේන්තුව විසින් විදේශ තැපැල් පරිපාලන ආයතන වෙත ගිණුම් සකස් කර ඉදිරිපත් කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට එම තැපැල් පරිපාලන ආයතන විසින් අනුමත කර නොමැති හිඟ ආදායම් ශේෂය රු. 126,877,470 ක් වූ අතර එය වර්ෂ 01 සිට වර්ෂ 07 ක් දක්වා කාල පරාසයක විහිදී තිබුණි. | 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ප්‍රකාශයේ ඇතුළත් 2022 වසරට අදාළ අනුමත නොවූ හිඟ ආදායමක් ලෙස සැලකූ ආදායම් මේ වන විට අනුමත වූ හිඟ ආදායමක් වශයෙන් අප වෙත ලැබීම සිදු වේ. එමෙන්ම ඉකුත් වසරවල අනුමත නොවූ ගිණුම් සම්බන්ධයෙන් අදාළ තැපැල් පරිපාලනයන් වෙත නිරන්තර සිහි කැඳවීම් මගින් නැවත නැවත මතක් කරමින් අය කරමින් පවතී. | විදේශ තැපැල් පරිපාලන ආයතන ආදායම අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| ii. | ඒසීඒ - 1 ආදායම් ප්‍රකාශනයේ මුදලින් ආපසු ගෙවීම් රු. 38,014,372 ක් හා වැරදි නිවැරදි කිරීම් රු. 8,230,015 ක් ලෙස ආපසු ගෙවීම් එකතුව රු. 46,244,387 ක් දක්වා ඇති අතර එයින් මුදලින් ආපසු ගෙවීම් සඳහා රු. 489,643 ක් හා වැරදි නිවැරදි කිරීම් රු. 6,957,315 ක් සඳහා අනුමැතිය ලබාදී නොතිබුණි. | ඉදිරියේදී අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ආදායමින් ආපසු ගෙවීම් සහ වැරදි නිවැරදි කිරීම් සඳහා අනුමැතිය ලබාගත යුතුය. |

**(ආ) ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2023 හි 7.7 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මුදල් හා හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගත යුතුය. ඒ අනුව දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් අයකර ගැනීම් රු. 757,965,259 ක් හා අත්තිකාරම් ගෙවීම් රු. 780,039,559 ක් වූ අතර දෙපාර්තමේන්තුව විසින් අත්තිකාරම් මුදලින් අයකර ගැනීම් රු. 750,299,645 ක් හා අත්තිකාරම් මුදලින් ගෙවීම් රු. 772,373,945 ක් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | ඉදිරියේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී හරස් සටහන් ගනුදෙනු ඇතුලත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරන ලෙස අදාළ නිළධාරීන් දැනුවත් කල බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිසි පරිදි පිළියෙල කළ යුතුය. |

## (ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අනුරාධපුර දිසා ගිණුම් කාර්යාලයේ 2018, 2019 සහ 2020 වර්ෂවල පැවැති රු. 2,123,825 ක වෙනත් ණය ශේෂය 2021 වර්ෂයේදී ඉවත් කර තිබුණද ඊට අදාළ ගිණුම් සටහන්, ලිපි ලේඛන, ලිපිගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මාසික වැටුපෙන් අයකර නිරවුල් කර ඇති බවද විගණනයට අවශ්‍ය ගිණුම් සටහන් හා ලේඛන ඉදිරි කාලය තුළ ඉදිරිපත් කරන බව පසුගිය වර්ෂයේදී පිළිතුරු වශයෙන් දක්වා තිබුණද එම තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අනුරාධපුර දිසා ගිණුම් කාර්යාලයෙහි රු.2,123,825 ක වෙනත් ණය ශේෂය නිරවුල් කිරීමට අදාළ ලිපි ලේඛන කඩිනමින් ලබා දීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | විගණනයට තොරතුරු නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | කළුතර දිසා ගිණුම් කාර්යාලයේ වර්ෂ 10 කට පෙර රු. 1,295,400 ක වටිනාකමැති මූල්‍ය වංචාවක් අනාවරණය වී තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විටත් එයින් රු. 1,145,850 ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. මේ පිළිබඳ විගණන වාර්තාවලින් පෙන්වා දුන්නද දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කළුතර දිසා ගිණුම් කාර්යාලයේ වර්ෂ 10 කට පෙර සිදුවී ඇති මූල්‍ය වංචාවෙන් තවදුරටත් අයකරගෙන නොමැති ශේෂය වන රු. 1,145,850 සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කෙරෙමින් පවතින බව දන්වා සිටිමි | දෙපාර්තමේන්තුව විසින් විමර්ශන කටයුතු අවසන් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ, සේවය හැරගිය සහ වෙනත් නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 57,810,684 ක් වූ අතර එයින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන ණය ශේෂය රු. 20,799,130 ක් විය. | තැපැල් දෙපාර්තමේන්තු රජයේ අත්තිකාරම් බී ගිණුමේ පවතින මියගිය, විශ්‍රාම ගිය, වැඩතහනම් හා සේවය හැරගිය නිලධාරීන්ගේ හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට අනුගමනය කළ යුතු චක්‍රලේඛ විධිවිධානයන්, උපදෙස් සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය ණය ශේෂයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශ නීති නිලධාරී සම්බන්ධ කරගනිමින් කටයුතු කරගැනීමට උපදෙස් සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී | හිඟ ණය ශේෂ අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | ගිණුමේ හිඟ ණය ශේෂයන් අයකරගැනීමට සියලුම ක්‍රියාමාර්ග අනුගමනය කර තවදුරටත් අයකර ගත නොහැකි ණය ශේෂයන් කපා හැරීම සඳහා යොමු කරන මෙන් දිසා පාලන නිලධාරීන් වෙත යොමු කර ඇත. | |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි හා පාඩු පිළිබඳ ලේඛනයේ හානිය සිදුවූ දිනය, හානිය පිළිබඳ විස්තරය සහ හානිය සිදුවූ අවස්ථාවේ ආසන්නතම අගය යන කරුණු පමණක් ඇතුළත් කර තිබුණි. | මු.රෙ 110 ප්‍රකාර හානි හා පාඩු ලේඛනය මේ වනවිටත් සකස් කර ඇති නමුත් විගණනයේ පෙන්වා ඇති ආකෘතියට අනුව සකස් කර නොමැති බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි හා පාඩු පිළිබඳ ලේඛනය පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ. 85(1) සහ මු.රෙ. 85(2) විධිවිධාන අනුව ආදායම් ඇස්තමේන්තු සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තු තාත්වික හා නිවැරදි ආකාරයට සකස් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ ආදායම් කාණ්ඩ 28 ක හිතකර විචලතාව රු. 160,046 සිට රු. 216,963,747 ක් දක්වා වූ පරාසයක පැවති අතර ආදායම් කාණ්ඩ 21 ක අහිතකර විචලතාවය රු. 107,625 සිට රු. 888,023,634 ක් දක්වා පරාසයක පැවතුණි. | හිතකර විචලතා - විදේශ විනිමය අනුපාතිකයේ ඉහළ යාම, උද්ධමන අනුපාතිකයේ වර්ධනය, විදුලි ගාස්තු වැඩිවීම, වාහන දඩ සඳහා අය කරන ගාස්තු වරින් වර ඉහළ යාම, මුද්දර අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් හා මුද්දර ප්‍රදර්ශන, පාරිභෝගික නැඹුරුව, කාර්යමණ්ඩලයේ කාර්යක්ෂම හා විශ්වාසදායී සේවාවන් නිසා, එම අපේක්ෂිත ආදායමට වඩා වර්ධනය වීමට හේතු වී ඇත.<br>අහිතකර විචලතා - සමස්ත මුද්දර ආදායම තැපැල් දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට අවසර ඉල්ලා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුමත නොවීම සහ සමහර තැපැල් සේවාවන් වෙනුවට විකල්ප මාධ්‍ය භාවිතයට පාරිභොගිකයා යොමු වීම වේ. | ආදායම් ඇස්තමේන්තු තාත්වික හා නිවැරදි ආකාරයට සකස් කළ යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 හි වගන්ති අංක 02(ඇ)(iii) ප්‍රකාරව වැය විෂයය සංකේතාංක 1002 - අතිකාල සහ නිවාඩු දින වැටුප් සහ 1003 - වෙනත් දීමනා සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන අවම වශයෙන් සියයට 06 කින් අඩු කළ යුතු බව දැක්වුවද දෙපාර්තමේන්තුව විසින් එලෙස කටයුතු සිදු නොකර වෙනත් දීමනා සියයට 03 කින් අඩුකර හා අතිකාල නිවාඩු දින වැටුප් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම් ලබාගෙන තිබුණි. | තැපැල් කාර්යාල 15 ක් දිගින් දිගටම සොරු බිඳීම් වලට ලක් වූ අතර එම තත්ත්වය පාලනය කර ගැනීම සඳහා 2023 සැප්තැම්බර් මස සිට මාස 3 ක කාලයක් සඳහා රාත්‍රී මුරකරුවන් යෙදීමට කටයුතු කළ බැවින්, අතිකාල හා නිවාඩු දින වැටුප් වැය විෂය සඳහා අනපේක්ෂිත වියදමක් දැරීමට සිදු වූ බැවින් දෙපාර්තමේන්තුව තුල වර්තමානයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ පවතින 3723 කට අධික පුරප්පාඩු ප්‍රමාණයද අතිකාල මඟින් ආවරණය කර ගැනීමට සිදුවූ බැවින් ද ලබාදී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමෙන් මු.රෙ. 66 යටතේ මාරු කිරීම් කර තිබුණි. | 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 හි වගන්ති අංක 02(ඇ)(iii) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2022 වර්ෂයේදී හඳුනාගත් රු. 1,459,584 ක නොපියවූ බැඳීම් බැරකම් වටිනාකමක් 2023 දෙසැම්බර් 31 දිනට පැවතුණි. | විගණන නිරීක්ෂණය පිළිගනිමි. මෙම නොපියවූ බැරකම් නිරවුල් කිරීමට කටයුතු කරන බවත් නිරවුල් කළ වහාම විගණනය වෙත වාර්තා කරන බවත් දන්වමි. | සියලු බැරකම් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| ii. | 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී භාවිතා කළ යුතු ආකෘතිවල දක්වා ඇති ඇමුණුම (III) ප්‍රකාරව සහ 2023 නොවැම්බර් 01 දිනැති අංක 04/2023 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 4.5 වගන්තියේ සඳහන් ලෙස නව සිගාස් වෙබ් පිටුවෙන් උඩුගත කරන ලද බැඳීම් හා බැරකම් ඇතුළත් කළ යුතු ලෙස දක්වා තිබුණද මු.රෙ. 94(3) යටතේ දක්වා ඇති රු. 170,781,353 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | අතපසු වීමකින් එසේ සටහන් වී ඇති අතර ඉදිරියේදී නිවැරදි කරන බව දන්වමි. | 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| iii. | මඩකලපුව දිසා ගිණුම් කාර්යාලය විසින් 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර ඇති රු. 3,984,903 ක බැඳීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් කටයුතු සිදු කරන ලෙස අදාළ නිළධාරීන් දැනුවත් කර ඇත. | සියලු බැරකම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතුය. |
| iv. | මු.රෙ. 94(2)(3) ප්‍රකාරව, රු. 17,587,359 ක් බැඳීම් හා බැරකම් ලෙස හඳුනාගත යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් ඉන් රු. 7,747,689 ක වටිනාකමක් බැඳීම් හා බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව බැඳීම් හා බැරකම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | සියලු බැරකම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතුය. |
| v. | 2024 ජනවාරි සිට මාර්තු දක්වා ගෙවීම් වවුචර් පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි දෙපාර්තමේන්තුව විසින් රු. 1,207,698 ක බැඳීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවලට හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව බැඳීම් හා බැරකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කරන බව කාරුණිකව දන්වමි. | සියලු බැරකම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| i. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 2.1, 31., 3.3, 3.5, 3.6 වගන්ති සහ 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | ඇඟිලි සළකුණු යන්ත්‍රයක් සවිකර තිබුණද ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සලකා බැලීමකින් තොරව පස්වරු 16.15 ට තැපැල් මූලස්ථානයෙන් පිටත්වන සේවකයින් රාත්‍රී 7, 8, 9, 10 යන වේලාවල්වල රාජකාරී සිදු කළ බව | තැපැල් දෙපාර්තමේන්තුවේ මේ වන විට පවතින තැපැල් සේවා නිලධාරි පුරප්පාඩු ගණන 1480 ක් වේ. තැපැල් මූලස්ථානයේ තැපැල් සේවා නිලධාරි තනතුරු 94 පුරප්පාඩුව පවතී. | ආයතන සංග්‍රහයේ යථෝක්ත විධිවිධාන හා 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සාවද්‍ය ලෙස දක්වා රු. 57,919,684 ක අතිකාල දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. මේ හේතුවෙන් ගෙවා තිබුණු අතිකාල දීමනා ගෙවීම්වල නිවැරදිතාවය විගණනයට පරීක්ෂා කළ නොහැකි විය. | | |
| ii. ශ්‍රී ලංකා - ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1645(ආ) | එක් එක් වාහනයේ රියදුරා ලවා 268 වැනි පොදු ආකෘති පත්‍රයේ දෛනික ධාවන සටහනක් තබා ගැනීමට සලස්වා පරිපාලන නිලධාරීන් ලවා නිතිපතා පරීක්ෂා කරවීම කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ වාහන 216 න් 59 ක සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මාසයක ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ වාහන 98 ක මාස කිහිපයක ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. ධාවන සටහන් ඉදිරිපත් නොවීම හේතුවෙන් වාහනවල ඉන්ධන භාවිතය පිළිබඳව පරීක්ෂා කළ නොහැකි විය. | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ධාවන සටහන් පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| iii. | 1992 අගෝස්තු 19 දින අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු වුවද තැපැල් දෙපාර්තමේන්තුවේ වාහන 123 ක රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | 1992 අගෝස්තු 19 දින අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තු--වේ සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කළ යුතුය. |

**2.5 තැන්පත් ශේෂයන්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී නිකුත් කරන ලද මාස 06 ක් ඉක්මවා ගිය චෙක්පත්වල වටිනාකම අදාළ මුදල් රෙගුලාසි 396(ඇ) අනුව කටයුතු කර රජයේ ආදායමට බැර කළ යුතු වුවත් එසේ සිදු නොකර නිකුත් කරන ලද නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකරන ලද රු. 263,500 ක් වටිනා චෙක්පතක් 2022 වර්ෂයේ සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. තවද 2023 වර්ෂයේ රු. 2,000 ක් වටිනාකමැති ගෙවීමට ඉදිරිපත් නොවුණු චෙක්පත් 03 ක්ද පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | මෙම මුදල් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු යොදා ඇත. | සියලුම තැන්පතු නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |
| ii. | 2022 දෙසැම්බර් 31 දින දක්වා බැංකු ප්‍රකාශනයේ හඳුනා නොගත් රු. 896,796 ක ලැබීම් එම වර්ෂයේදී හඳුනා ගෙන නිරවුල් නොකර 2022 වර්ෂයේ පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණු අතර එම ශේෂය 2023 දෙසැම්බර් 31 දින දක්වාම | බැංකු ප්‍රකාශනයෙහි මෙය මුදල් ලැබීමක් ලෙස සඳහන් වුවද එම ලැබීම් හඳුනා ගැනීමට අපහසු වී ඇති හෙයින් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන ඇති අතර ඉදිරියේදී හඳුනාගත් වහාම ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | සියලුම තැන්පතු නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. තවද 2023 දෙසැම්බර් 31 දින බැංකු ප්‍රකාශනයේ හඳුනා නොගත් රු. 149,990 ක ලැබීම් සමාලෝචිත වර්ෂයේදී හඳුනාගෙන නිරවුල් නොකර පොදු තැන්පතු ගිණුමට මාරුකර තිබුණු අතර එම ශේෂයද 2023 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | | |
| iii. | සමාලෝචිත වර්ෂය අවසානයට තෙවන පාර්ශවය වෙනුවෙන් නැවත ගෙවීම සඳහා රඳවාගන්නා (13/39) තැන්පත් මුදල රු 5,875,138 .ක් වූ අතර ඉන් රු 2,104,880 .ක මුදල වර්ෂ 02 ඉක්මවූ තැන්පත් මුදල් වන අතර ඒ සම්බන්ධව මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාළ ආයතන විසින් ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර නොමැති බැවින් හා වැටුපෙන් රඳවා ගත් සියයට 20 ක සෙනසුරාදා දීමනාව නැවත අදාළ නිලධාරීන්ට ගෙවීම සඳහා පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇත. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| iv. | 2021 වර්ෂයට අදාළව සිදුකරනු ලැබූ ප්‍රසම්පාදන කාර්යයන් 03 කට අදාළව ලබාගෙන තිබුණු රු. 4,331,100 ක් වටිනාකමැති කාර්යසාධන බැඳුම්කර පවරාගෙන රාජ්‍ය ආදායමට බැර නොකර පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | අදාළ ආයතන විසින් ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර නොමැති බැවින් නැවත ගෙවීම කර නොමැත. ඉල්ලීම් ලිපි ඉදිරිපත් කල පසු ගෙවීම් සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ප්‍රසම්පාදන කාර්යයන් අවසන් නම් හා ආයතන ඉල්ලීම් ලිපි ඉදිරිපත් නොකරන්නේ නම් රාජ්‍ය ආදායමට බැර කළ යුතුය. |
| v. | වැටුපෙන් අය කර සේවක අර්ථසාධක අරමුදලට යැවිය යුතු රු. 202,971 ක වාරිකය හලාවත දිසා ගිණුම් කාර්යාලය විසින් පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | 2024 ජනවාරි මස රු. 179,050 ක් නිරවුල් කර ඇති අතර රු. 16,921 ක් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. | සේවක අර්ථසාධක අරමුදලට යැවිය යුතු වාරික මුදල් නොපමාව යැවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| vi. | මහනුවර දිසා ගිණුම් කාර්යාලයේ රු. 460,000 ක නිවාඩු නිකේතන ගාස්තු දෙපාර්තමේන්තු ආදායම් ලෙස හඳුනා නොගෙන පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | නිකේතන භාරකරුට සේවා හා පහසුකම් සඳහා වියදම් දැරීමට අවශ්‍ය වූ විට පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇති මුදලින් අවශ්‍යතා ලබා දෙන අතර, එසේ වියදම් කර ඉතිරි වන මුදල වසර දෙකක් අවසානයේ රාජ්‍ය ආදායමට බැර කරනු ලබයි. ඉදිරියේදී නියමිත කාලය සම්පූර්ණ වූ පසු මෙම මුදල් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | සියලුම ආදායම් නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |
| vii. | 2021 ජනවාරි 19 දින මාතර දිසා ගිණුම් කාර්යාලයට අයත් කඹුරුපිටිය තැපැල් කාර්යාලයේ තාප්පය සංවර්ධන කටයුතුවලදී කැඩී යාම හේතුවෙන් එය පිළිසකර කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලද රු. 284,000 ක වටිනාකම සමාලෝචිත වර්ෂයෙ අවසන් වන තෙක්ම පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | ඉදිරියේ දි පොදු තැන්පත් ගිනුමෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | කඹුරුපිටිය තැපැල් කාර්යාලයේ තාප්පය පිළිසකර කළ යුතුය. |
| viii. | මාතර දිසා ගිණුම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී සේවක වැටුප් ගෙවීමේදී අයකරනු ලබන උපයන විට ගෙවීමේ බදු රු. 367,559 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | උපයන විට බදු අයකිරීමේදී සිදු වූ වැරදි ගණනය කිරීමක් නිසා මේ වන තෙක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන ඇති අතර මේ සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලිඛිතව විමසීමක් කර ඇති අතර ඒ සඳහා පිළිතුරක් ලද වහාම නිරවුල් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | උපයන විට ගෙවීමේ බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුය. |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දිසා ගිණුම් කාර්යාල 10 ක, මධ්‍යම තැපැල් හුවමාරුව, මුද්දර කාර්යාංශය සහ ප්‍රධාන කාර්යාලයේ බැංකු ගිණුම් 16 ක ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 කට වැඩි චෙක්පත් | විගණනය විසින් පෙන්වා දී ඇති ගෙවීමට ඉදිරිපත් නොකල මාස 6 කට වැඩි චෙක්පත්වල හා හඳුනා නොගත් ලැබීම් වටිනාකම් අතර වෙනස්කම් දෙපාර්තමේන්තු බැංකු සැසඳුම් පරීක්ෂා කිරීමේදී පැවති අතර එම වටිනාකම් විස්තරාත්මකව ඉදිරිපත් කලහොත් | ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ. 396(ඇ) ප්‍රකාරවද, හඳුනා නොගත් ගෙවීම් සහ ලැබීම් හඳුනා ගැනීමටද කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| රු. 815,181 ක්ද, හඳුනා නොගත් ගෙවීම් රු. 12,923,311 ක්ද සහ හඳුනා නොගත් ලැබීම් රු. 117,501,036 ක්ද විය. | නිවැරදිව පිළිතුරු ලබාදිය හැකි බව කාරුණිකව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරිම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තැපැල් දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති වාර්තාවට අනුව වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව වූ ව්‍යාපෘති 347 න් ව්‍යාපෘති 169 ක් අවසන් කළ බව සඳහන් කර තිබුණු අතර ව්‍යාපෘති 178 ක් අහෝසි කර තිබුණු බව නිරීක්ෂණය විය. | 01/2023 හා 02/2023 චක්‍රලේඛයන් අනුව රාජ්‍ය වියදම් දැරීම සීමා වූ බැවින් 2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ සඳහන්ව තිබූ ව්‍යාපෘති 347 න් ව්‍යාපෘති 178 ක් සිදු කිරීමට නොහැකි වීමෙන් අහෝසි කිරීමට සිදු විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණු ව්‍යාපෘති 165 ක් අංක 308-2-01-2001 දරන වැය විෂය යටතේ 2023 වර්ෂයේදී සිදුකර තිබුණි | අදාළ අලුත්වැඩියා කටයුතු අවශ්‍යතාවය මත හඳුනාගන්නා බැවින් පෙර පුරෝකතනයකින් ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කිරීමට නොහැකි නිසා අදාළ වාර්තාවේ සටහන් වී නොමැත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ ප්‍රධාන කාර්යාලය යටතේ ව්‍යාපෘති 18 ක් දක්වා ඇති අතර එයට වෙනත් පළාත්වල ව්‍යාපෘති 02 ක් වන Chunnakam තැපැල් කාර්යාලයේ අලුත්වැඩියාවට අදාළ දැන්වීම පල කිරීම සඳහා දරන ලද රු. 62,755 ක වියදමක්ද, මඩකලපුව තැපැල් කාර්යාලයේ විදුලිය සම්බන්ධව කරන ලද රු. 6,049,525 ක වියදමක්ද ඇතුළත් කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 වර්ෂයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරා දී තිබුණු පොළොන්නරුව තැපැල් සංකීර්ණය ඉදිකිරීම දෙවන අදියර යන ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 50 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර රු. 6,977,960 ක මූල්‍ය වියදමක් දරා තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට එහි භෞතික ප්‍රගතිය සියයට 04 ක් විය. | අදහස් දක්වා නොමැත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | විගණනයට ඉදිරිපත් කළ කාර්යසාධන වාර්තාවේ Payment to Colbert Software Solution (PVT) Ltd for Development of Philatelic Bureau Module ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ 04 වන කාර්තුව වන විට රු. 2,250,000 ක මූල්‍ය වියදමක් දරා තිබුණු අතර එහි භෞතික ප්‍රගතිය සියයට 23 ක් විය. තවද එම ව්‍යපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන සඳහන් කර නොතිබුණි. | පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කර නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ආරම්භ කරන ලද අතර 2023 දෙසැම්බර් 31 දින වන විට ලබා දී ඇති මුදලෙන් රු. 6,977,960ක මුදලක් වියදම් කරමින් රු. 43,022,040ක මුදලක් නැවත තැපැල් දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඇත. එදිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය වශයෙන් 4% ක් විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | කාර්යසාධන වාර්තාවේ මධ්‍යම පළාතට අදාළ ව්‍යාපෘතියක් වන Building Renovation Kandy PO Professional Expert Engineering Service Fee යන ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. 355,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර රු. 355,000 ක් ලෙස මූල්‍ය ප්‍රගතිය දක්වා තිබුණද භෞතික ප්‍රගතිය දක්වා නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතියක් බව කාරුණිකව දන්වා සිටිමි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් ගිවිසුමේ 8.2 වගන්තිය ප්‍රකාරව මඩකලපුව තැපැල් සංකීර්ණය ඉදිකිරීම 2021 මාර්තු 12 දිනෙන් අවසන් කිරීමට නියමිතව තිබුණද අවස්ථා 05 කදී දින දීර්ඝ කිරීම සිදුකර තිබුණි. ඒ අනුව මෙම කොන්ත්‍රාත්තුව 2023 නොවැම්බර් 30 දින වන විට සම්පූර්ණ කළ යුතුව තිබුණද මෙම කොන්ත්‍රාත්තුව 2024 වර්ෂයේද අවසන් කර තිබුණද 2023 නොවැම්බර් 30 දින සිට කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමක්ද සිදුකර නොතිබුණි. | මඩකලපුව තැපැල් සංකීර්ණය විවෘත කල හැකි කාලය හා තවදුරටත් අත්‍යාවශ්‍ය ඉදිකිරීම් පිළිබඳව තීරණය කිරිම සඳහා 2023 ඔක්තෝබර් 16 දින ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව නිරීක්ෂණය කරන ලද කරුණු අතිරේක වැඩ ලෙස සඳහන් කරමින් කඩිනමින් ගොඩනැඟිල්ලේ වැඩ අවසන් කරන ලෙස 2023 නොවැම්බර් 01 දින ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත ලිපි යොමුකරන ලද අතර, කොන්ත්‍රාත් කාලය 2023 නොවැම්බර් 30 දින දක්වා දීර්ඝ කරන ලදී. ඔබගේ පහසු දැන ගැනීම සඳහා දින දීර්ඝ කරන ලද ලිපියේ පිටපතක් මේ සමඟ එවමි. | කොන්ත්‍රාත්තුව නියමිත දිනවල අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මඩකලපුව පැරණි තැපැල් සංකීර්ණය කඩා ඉවත් කිරීමේදී ඉවත් කරන ලද ලී හා උළු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තක්සේරුකරුවෙකු මගින් රු. 39,375 ක් ලෙස තක්සේරු කර 2022 ජූලි 15 දින මඩකලපුව ප්‍රාදේශීය තැපැල් අධිකාරී කාර්යාලය වෙත ලබාදී තිබුණි. එම ලී හා උළු ලැයිස්තුගත කර නොමැති අතර භාණ්ඩ දිරාපත්ව ගොඩ ගසා ඇති හෙයින් දැනට ඉතිරිව ඇති භාණ්ඩ වෙන්දේසි කිරීමට 2023 සැප්තැම්බර් 18 දින කමිටුවක් පත් කළද එම ලී හා උළු වෙන්දේසි කර නොතිබුණි | මඩකලපුව තැපැල් සංකීර්ණයේ ඉදිරිපස තාප්පය ඉදිකිරීමේදී තාප්පයේ එක් කෙළවරක ඉදිකිරීම් සිදු කිරීමට අවසර ලබා දිය නොහැකි බව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වාචිකව පවසන ලදී. ඒ අනුව මාර්ග සංවර්ධන කටයුත්තක් සිදු වන අවස්ථාවකදී වන්දි ලබා ගැනීමේ පදනමකින් තොරව ඉවත් කිරීමේ පදනම මත මඩකලපුව තැපැල් සංකීර්ණයේ ඉදිරිපස තාප්පයේ ඉදිකිරීම් සිදු කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ලිපියක් 2023 නොවැම්බර් 02 දිනැතිව යොමු කරන ලදී. ඒ අනුව එම ලිපිය ප්‍රමාණවත් බවත් නැවත ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීමට ලිපි යොමු නොකරන බව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශ කරන ලදී. තාප්පයේ කෙළවරක කුඩා කොටසක් ඉදිකිරීමට නොහැකි වීමෙන් තාප්පය ඉදිකිරීමට නොහැකිවුවහොත් රජයේ දේපල ආරක්ෂා කිරීමට නොහැකිවනු ඇති බව සඳහන් කරමි. | ලී සහ උළු වෙන්දේසි කිරීමට හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඈ) | මඩකලපුව තැපැල් සංකීර්ණයේ තාප්පය ඉදි කිරීමේදී ඉදිරියේදී මාර්ග සංවර්ධන කටයුත්තක් සිදුවන අවස්ථාවකදී වන්දි ලබා ගැනීමකින් තොරව ඉවත් කිරීමේ පදනම මත තාප්පය ඉදි කිරීම හේතුවෙන් රජයේ මුදල් අනවශ්‍යා ලෙස වැය කිරීමක් ලෙස විගණනයට නිරීක්ෂණය විය. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වෙන්කර ඇති ප්‍රතිපාදන සීමාව තුල ගොඩනැඟිල්ල භාවිතා කිරීමට හැකි වන පරිදි අත්‍යාවශ්‍ය වැඩ කොටස් හඳුනාගැනීමට ගොඩනැඟිල්ලේ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකරන ලදී. ඒ අනුව හඳුනාගත් අත්‍යාවශ්‍ය වැඩ කොටස් ඉටු කර දෙන ලෙස CECB ආයතනය වෙත දැනුම් දෙන ලදී. | ඉදිකිරීම් සඳහා අදාළ ආයතනවලින් අනුමැතිය ලබාගත යුතුය. |

**3.3 ප්‍රසම්පාදනයන්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **Miniature Sheets of Sri Lanka (ISBN 978–955-9482-13-0) ප්‍රකාශනය මුද්‍රණය කිරීම** | | |
| i. | තැපැල් දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී Miniature Sheets of Sri Lanka ප්‍රකාශනය එක් පිටපතක් රු. 4,860 බැගින් පිටපත් 500 ක් රු. 2,430,000 කට මුද්‍රණය කර තිබුණු අතර එක් ප්‍රකාශනයක් නිර්මාණය කිරීම සඳහා භාවිතා කර ඇති සිහිවටන පත්‍රිකා සංඛ්‍යාව 118 ක් වූ බැවින් ප්‍රකාශන 500 ක් සඳහා භාවිතා කර ඇති සිහිවටන ප්‍රමාණය 59,000 ක් විය. එක් ප්‍රකාශනයක ඇති සිහිවටන ප්‍රතිකාවල වටිනාකම රු. 8,244 ක් වූ අතර සිහිවටන පත්‍රිකාවල මුළු වියදම රු. 4,122,125 ක් විය. මෙම වියදම්වලට අමතරව සිහිවටන පත්‍රිකා රඳවන මිලදී ගැනීම සඳහා යූරෝ 6,415 ක්ද වියදම් කර තිබුණි. කෙසේ වුවත් 2024 මාර්තු 13 දින | අදහස් දක්වා නොමැත | රජයට සිදුවූ අලාභය අයකර ගැනීම සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විගණනය විසින් සිදුකරන ලද පරීක්ෂාවේදී රු. 6,552,125 ක් සහ යූරෝ 6,415 ක් වැය කර මුද්‍රණය කළ කිසිඳු ප්‍රකාශනයක් අලෙවි කර නොතිබුණු බව නිරීක්ෂනය විය. | | |
| ii. | එම ප්‍රකාශන සීල් කර අල්මාරියක ගබඩා කර තිබුණු අතර ඒ පිළිබඳව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කළ වාර්තාවට අනුව එම අල්මාරිය තුළ ප්‍රකාශන 482 ක් තිබුණු බවත් ඒ අනුව ප්‍රකාශන 18 ක ඌනතාවයක් පවතින බවත් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත | රජයට සිදුවූ අලාභය අයකර ගැනීම සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ කළ යුතුය. |
| iii. | Miniature Sheets of Sri Lanka කිසිඳු පිටපතක් 2024 මාර්තු 13 දින වන විට අලෙවි කර නොමැති බැවින් රජයට සිදු කළ රු. 6,552,125 සහ යූරෝ 6,415 ක අලාභය අයකර ගැනීම සඳහා මුදල් රෙගුලසි ප්‍රකාර පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | රජයට සිදුවූ අලාභය අයකර ගැනීම සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වෙනත් යන්ත්‍ර හා උපකරණවල ආරම්භක ශේෂය රු. 415,360,915 ක් වුවද එහි ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය රු. 415,448,515 ක් විය. ඒ අනුව වෙනස රු. 87,600 ක් විය. මෙම වෙනසට හේතු විගණනයට | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂය සහ ඉකුත් වර්ෂයේ අවසාන ශේෂයන් අතර රු. 87,600 වෙනස 2024.01.01 දින නිවැරදි කර ඇති බව දන්වා සිටිමි. | වෙනසට හේතු පැහැදිලි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පැහැදිලි නොකෙරුණි. | | |
| (ආ) | කෙරීගෙන යන වැඩ ගිණුමට යා යුතු රු. 27,985,429 ක් නේවාසික නොවන ගොඩනැගිලි ගිණුමට සටහන් කර තිබුණි. | කෙරීගෙන යන වැඩ ගිණුමට යායුතු රු. 27,985,429 ක් නේවාසික නොවන ගොඩනැගිලි ගිණුමට සටහන් කර ඇති අතර එය 2024 අප්‍රේල් ගිණුම් සාරාංශය තුළින් නිවැරදි කර ඇති බව දන්වා සිටිමි. | ගිණුම් අඩුපාඩු නිවැරදි කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගත් රු. 896,711 ක් වූ වත්කම් සඳහා උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත ලබා දුන් උපලේඛනයේ දිසා ගිණුම් කාර්යාල කිහිපයකට අදාළව ආරම්භක ශේෂයන් කිහිපයක් වරදවා මිලදී ගැනීම් ලෙස දක්වා ඇත. නිවැරදි කරන ලද උප ලේඛනය ඉදිරිපත් කරමි. සමාලෝචිත වර්ෂය තුල දී අපහරණය කරන ලද රු. 11,295 ක අගය සඳහා විස්තරය ඉදිරිපත් කර ඇති බව දන්වා සිටිමි. | වත්කම් සඳහා උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම්, ගොඩනැගිලි, කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩවලට අදාළව දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ උපලේඛනය හා 2023 දෙසැම්බර් 31 දිනට සිගාස් වැඩසටහනේ දක්වා ඇති වටිනාකම් අතර වෙනස රු. 82,902,505 ක් විය. | අදහස් දක්වා නොමැත. | වෙනසට හේතු පැහැදිලි කළ යුතුය. |
| (ඉ) | දෙපාර්තමේන්තුව විසින් 2023 දෙසැම්බර් 31 දින වන විට විධිමත්ව පවරා නොගත් තැපැල් කාර්යාල 449 ක් විය. | තැපැල් කාර්යාල 651 න් 154 ක් කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන අතර ඉතිරි තැපැල් කාර්යාල 497 ක ප්‍රමාණයෙන් 2024 මාර්තු 31 දින වන විට තැපැල් දෙපාර්තමේන්තුව වෙත විධිමත්ව පවරාගත් තැපැල් කාර්යාල සංඛ්‍යාව 104 කි. පවරා නොගත් ඉතිරි තැපැල් කාර්යාලද විධිමත්ව පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. | පවරාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් පවරාගෙන ඇති නමුත් තක්සේරු කර නොමැති | 2023 දෙසැම්බර් 31 දිනට පවරා ගෙන ඇති නමුත් තක්සේරු නොකළ ඉඩම් හා ගොඩනැගිලිවලට අදාළව ඉඩමේ හා ගොඩනැගිලි සැලැස්ම, ඉඩමේ | තක්සේරු කර නොමැති ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගත |

| | | | |
|---|---|---|---|
| | ඉඩම් ප්‍රමාණය 68 ක් සහ ගොඩනැගිලි ප්‍රමාණය 63 ක් විය. | පිඹුරු හා පැවරීම් සහතිකය වැනි ලියකියවිලිවල පවතින අඩුපාඩු හේතුවෙන් තක්සේරු කිරීමට ප්‍රමාද වී ඇති අතර ඉදිරියේදී කඩිනමින් තක්සේරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | යුතුය. |
| (උ) | 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු ඌන උපයෝජිත ඉඩම් ප්‍රමාණය 16 ක් විය. | රාජ්‍ය වියදම් කළමනාකරණය යටතේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබා නොදීම හේතු කොටගෙන විමසුමේ සඳහන් ඉඩම් 16 ඌන උපයෝජිතව පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | ඌන උපයෝජිත ඉඩම් වෙනුවෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඌ) | 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව භාවිතයට නොගන්නා භූමි ප්‍රමාණයන් තිබියදී කුලී පදනම මත තැපැල් කාර්යාල 03 ක් පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. | රාජ්‍ය වියදම් කළමනාකරණය යටතේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබා නොදීම හේතු කොට ගෙන විධිමත්ව ඉඩම් කොටස් පවරා ගෙන තිබියදී උවත් තව දුරටත් විමසුමේ සඳහන් කාර්යාල තුන කුලී පදනම මත පවත්වාගෙන යාමට සිදු වී තිබෙන බව දන්වා සිටිමි. | භාවිතයට නොගන්නා ඉඩම් භාවිතයට ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (එ) | තැපැල් දෙපාර්තමේන්තුව විසින් කුලී ගෙවමින් තැපැල් කාර්යාල 154 ක් සහ උප තැපැල් කාර්යාල 2,280 ක් පවත්වාගෙන ගොස් තිබුණි. | විගණන විමසුම නිවැරදියල දිවයින පුරා තැපැල් කාර්යාල 154 ක් කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන අතර උප තැපැල් කාර්යාල 2280 ක් උප තැපැල් ස්ථානාධිපති විසින් කුලී ගෙවමින් පවත්වාගෙන යනු ලබන බවද කාරුණිකව දන්වමි. | භාවිතයට නොගන්නා ඉඩම් භාවිතයට ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඒ) | 2023 දෙසැම්බර් 31 දින වන විට වසා දමා තිබුණු උප තැපැල් කාර්යාල සංඛ්‍යාව 29 ක් විය. | මෙම වසාදමා ඇති උප තැපැල් කාර්යාල වසා දැමීම සිදු කරනු ලබන්නේ තාවකාලිකව වන අතර එසේ තාවකාලිකව වසා දැමීමට හේතු පහත පරිදි ඉදිරිපත් කරමි.<br>(I) ඉතා අඩු ආදායම් ලබමින් පවත්වාගෙන යනු ලබන උප තැපැල් කාර්යාලයක් තව දුරටත් පවත්වාගෙන යාමෙන් දෙපාර්තමේන්තුවට දැරීමට සිදුවන අනවශ්‍ය පිරිවැය අවම කර ගැනීම. | වසා දමා තිබුණු උප තැපැල් කාර්යාල නැවත විවෘත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | (II) එලදායී ලෙස ආදායම් ඉපයීමට හැකි වෙනත් ප්‍රදේශයක වසා දැමූ උප තැපැල් කාර්යාල ස්ථාපිත කිරීම. | |
| (ඔ) | තැපැල් මූලස්ථානය පිහිටි ඉඩම, ඕල්කට් මාවතේ පිහිටි තැපැල් ප්‍රවාහන අංශය පිහිටි ඉඩම, නාරාහේන්පිට අධිකාරී (සැපයුම්) කාර්යාලය සහ යාන්ත්‍රික ඉංජිනේරු අංශය පිහිටි ඉඩම, මධ්‍යම තැපැල් හුවමාරුව පිහිටි ඉඩම සහ ජනාධිපති මාවතේ ප්‍රධාන තැපැල් කාර්යාලය පිහිටි ඉඩම 2023 දෙසැම්බර් 31 දිනට තැපැල් දෙපාර්තමේන්තුවට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | ජනාධිපති මාවතේ ප්‍රධාන තැපැල් කාර්යාලය පිහිටි ඉඩම හැර අනෙකුත් ඉඩම් සඳහා විධිමත්ව පවරා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇත. ජනාධිපති මාවතේ ප්‍රධාන තැපැල් කාර්යාලය ජනාධිපති ලේකම් වෙත පවරා ගැනීම සඳහා 2019 ජුනි 13 දින ඉල්ලීම් කරන ලද අතර 2019 ජූලි 09 දින පවරා දී ඇත. | පවරාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) | තැපැල්පති නමින් ලියාපදිංචි කර ඇති වාහන සම්බන්ධයෙන් තැපැල් දෙපාර්තමේන්තුවෙන් හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු සැසඳීමේදී වාහන 42 ක් සම්බන්ධ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණු අතර අංක 60 ශ්‍රී 7256 දරන බස් රථය භාවිතයෙන් ඉවත් කර තිබුණද ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. | තැපැල්පති නමින් ලියාපදිංචි කර වාහන 42 සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව මගින් ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. 60 ශ්‍රී 7256 අංක දරන බස් රථය මුද්දර කාර්යාංශයේ ප්‍රදර්ශන රථයක් ලෙස යොදා ගැනීම සඳහා අළුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | තැපැල්පති නමින් ලියාපදිංචිව ඇති සියලුම වාහන හඳුනාගත යුතුය. භාවිතයෙන් ඉවත් කර තිබුණු බස් රථය වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 පාඩු හා හානි

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 05 – 10 ත් අතර කාලයට අයත් රු. 754,422 ක සහ වර්ෂ 10 ට වැඩි රු. 12,527,541 | මෙහි ඇතුලත් බොහෝ අලාභ සිදුවී වසර 10 අධික කාලයක් ගතවී ඇති අතර එම හානි බොහොමයක් භීෂණ සමයේදී ත්‍රස්තවාදි ක්‍රියා හේතුවෙන් සිදුවී ඇති හෙයින් විමර්ශන වාර්තා,. | අලාභ අය කරගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක ශේෂවල එකතු වටිනාකම වූ රු. 13,281,963 ක ශේෂයක් තවදුරටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් අපොහොසත් වී තිබුණි. | පොලිස් වාර්තා, අතුරු වාර්තා, නඩු වාර්තා සපයා ගැනීමට ඇති අපහසුතාවය හා ඇතැම් අලාභ සම්බන්ධයෙන් නඩු පවරාතිබීම් වැනි කරුණු හේතුවෙන් අදාළ කපා හැරීම් සිදුකිරීම් ප්‍රමාදයට හේතුවී ඇත. රු. 2,477,444 ක අලාභය 2024 ප්‍රතිපාදන මගින් කපාහැර ඇත. අලාභ කපා හැරීම් කරන ලද ගොණු සම්බන්ධ විස්තර විගණන අංශය වෙතද යොමු කර ඇති බව කාරුණිකව දන්වා සිටින අතර කපා නොහැර ඉතිරිවූ හානි පාඩු ද මේ වසර තුල කපා හැරීමට හෝ අයකර ගැනීමට කටයුතු කරමි. | |
| (ආ) | දෙපාර්තමේන්තුවේ වාහන අනතුරු ලේඛනයට අනුව 2023 වර්ෂයට අදාළ වාහන අනතුරු 49 ක් සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය. එම වාහන අනතුරුවලින් අනතුරු 13 ක් සඳහා රු. 25,000 ට වඩා අඩු අලුත්වැඩියාවන් සිදුකර තිබුණු අතර වාහන අනතුරු 10 ක් සඳහා රු. 25,000 ට වැඩි අලුත්වැඩියාවන් සිදුකර ඇති බවත් වාහන අනතුරු 10 කට අදාළ වාහන යාන්ත්‍රික ඉංජිනේරු අංශය වෙත යොමුකර අලුත්වැඩියා කෙරෙමින් පවතින බවත් මූල්‍ය ප්‍රකාශනවල උපලේඛන 01, උපලේඛන 02 සහ උපලේඛන 04 හි සඳහන් කර තිබුණි. ඒ අනුව වාහන අනතුරු 49 න් වාහන අනතුරු 16 ක් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි. | මෙම වාහන 16 අතරින් LH - 4017 දරන වාහනය අමතර කොටස් නොමැති වීම හේතුවෙන් හානිය තක්සේරු කළ නොහැකි වීම. GS -8329 දරන වාහනය ඇස්තමේන්තු අනුමැතිය සඳහා යොමු කිරීම. GE-5935 දරන වාහනය නොමිලයේ අලුත්වැඩියාවක් සිදු කිරීම. එසේම GE-5749 දරන වාහනය සහ GS -8373 දරන වාහන අලුත්වැඩියාවක් සඳහා පිටත අනුමත ගරාජයකට යොමු කිරීම. LL -8974 වාහනය කුඩා අනතුරක් බැවින් යාන්ත්‍රික ඉංජිනේරු අංශය විසින් අලුත්වැඩියා කිරීම. එසේම PI-4542 වාහනය රක්ෂණාවරණය යටතේ අළුත්වැඩියා කිරීම සිදුකර ඇත. ඉතිරි වාහන අනතුරු ලේඛනයේ සඳහන් වුවද මූල්‍ය ප්‍රකාශණයට තොරතුරු ලබා දෙන අවස්ථාව වන විට යාන්ත්‍රික ඉංජිනේරු අංශය වෙත යොමු කර නොතිබූ බව කාරුණිකව දන්වමි<br>ඒ අනුව ඉහත කරුණු හේතු කොටගෙන මූල්‍ය ප්‍රකාශන වල පාඩු හා අත්හැරීම් ලේඛනයේ ඉහත අනතුරු ඇතුලත් කිරීමට නොහැකි වූ බව කාරුණිකව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය නිවැරදිව පිළියෙළ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් පාඩු හා අත්හැරීම් ප්‍රකාශයේ රු. 25,000 ට අඩු අලාභය කපා හැරීමට හෝ අත් හැරීමට ඇති පාඩුවල ඇතුළත් එකතුව රු. 17,121 ක අලාභ හානි කපා හැරීමට අනුමැතීන් ලබා තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | අලාභ කපා හැරීම් සඳහා අනුමැතිය ලබා තිබුණද 2023 වර්ෂයට අයත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2023 වර්ෂයේදි අලාභ කපාහැරීමට නොහැකි වූ අතර 2024 ප්‍රතිපාදන මත අලාභය කපා හරින ලදි. | අනුමැතීන් ලැබුණු අලාභහානි කපා හැරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් පාඩු හා අත්හැරීම් ප්‍රකාශයේ රු. 25,000 ට වැඩි අලාභය කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩුවල ඇතුළත් එකතුව රු. 1,928,583 ක අලාභ හානි කපා හැරීමට අනුමැතීන් ලබා තිබුණද සමාලෝචිත වර්ෂය තුළ කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | අලාභ කපා හැරීම් සඳහා අනුමැතිය ලබා තිබුණද 2023 වර්සයට අයත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2023 වර්ෂයේදි අලාභ කපාහැරීමට නොහැකි වූ අතර 2024 ප්‍රතිපාදන මත අලාභය කපා හරින ලදි. | අනුමැතීන් ලැබුණු අලාභහානි කපා හැරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2023 වර්ෂයේදී රු. 6,751,419 ක ටයර්, ටියුබ් සහ රිම් ටේප් මිලදී ගැනීමේදී පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් දෙකෙන්ම වියදම් දරා තිබුණු අතර නාරාහේන්පිට යාන්ත්‍රික ඉංජිනේරු අංශයද පුනරාවර්තන වැය විෂයයෙන් රු. 266,373 ක් වැය දැරීම සිදුකර තිබුණි. මෙසේ වැය විෂයයන් කිහිපයකින් මුදල් නිකුත් කර තිබීම විගණනයට ගැටලු සහගත විය. | මින් ඉදිරියට නිවැරදි වැය විෂය යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ටයර්, ටියුබ් සහ රිම් ටේප් මිලදී ගැනීමට සඳහා එක් වැය විෂයයකින් මුදල් වියදම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික අවශ්‍යතාවය පිළිබඳ සැලකීමකින් තොරව ටියුබ්, රිම් ටේප් සහ ටයර් මිලදී ගෙන තිබුණි. ඒ හේතුවෙන් 2007 පෙබරවාරි 22 දින මිලදී ගත් ටියුබ් 88 ක්, රිම් ටේප් 78 ක් සහ 2010 මැයි 25 දින මිලදී ගත් යටර් 13 ක් 2023 නොවැම්බර් 16 දින වන විටත් ගබඩාවේ පැවතුණි. | අදහස් දක්වා නොමැත | අවශ්‍යතාවය පරිදි මිලදී ගත යුතුය. |
| (උ) | තැපැල් දෙපාර්තමේන්තුවේ වාහන අනතුරු ලේඛනය අනුව 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පිළිවෙලින් වාහන අනතුරු 52, 67, 64, 47, 49 ක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. එසේම වාහන 05 ක් වර්ෂය තුළද අවස්ථා කීපයකදී අනතුරුවලට ලක්වී තිබුණි. වාහන අනතුරු සම්බන්ධ මුදල් රෙගුලාසි අංක 104 ප්‍රකාරව කටයුතු සිදු කර රජයට සිදුවූ අලාභය අය කරගෙන නොතිබුණි | අදහස් දක්වා නොමැත | රජයට සිදුවූ අලාභය අයකර ගැනීමට මුදල් රෙගුලාසි පරීක්ෂණ කළ යුතුය. |
| (ඌ) | එක් එක් වාහනය සඳහා එක් අනතුරු ලිපිගොනුවක් ආරම්භ කර සෑම අනතුරක්ම ප්‍රවාහන අංශය භාර මාණ්ඩලික නිලධාරියාට දැනුම් දීම, පොලිස් ස්ථානයට දැනුම් දීම, පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයක් සිදු වන්නේ නම් ප්‍රාරම්භක පරීක්ෂණ සඳහා කමිටු පත් කිරීම, ප්‍රාරම්භක කමිටු වාර්තා හා පූර්ණ වාර්තා, අලුත්වැඩියා වියදම, රක්ෂණයෙන් ආවරණය වූ | අදහස් දක්වා නොමැත | සියලු තොරතුරු ඇතුළත් කර වාහන අනතුරු ලේඛනය පිළියෙල කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | මුදල, අලාභයේ වටිනාකම, එම අලාභය අය කිරීමට ගත් ක්‍රියාමාර්ග ඇතුළත් කර වාහන අනතුරු ලේඛනය පිළියෙල කර නොතිබුණි. | | |
| (එ) | 2013 ජනවාරි 01 දින සිට 2014, 2015, 2016, 2017 සහ 2018 වර්ෂවල සිදුවූ වාහන අනතුරු සම්බන්ධ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | රාජ්‍ය ගිණුම් කාරක සභාවේ අවශ්‍යතාවයක් බැවින් වාහන අනතුරු සම්බන්ධ විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිට්සුබිෂි වාහන අලුත්වැඩියා සඳහා අමතර කොටස් හා උපාංග මිලදී ගැනීම සඳහා එකතු කළ අගය මත බදු සහිත වටිනාකම රු. 32,772,947 කට සීමාසහිත යුනයිටඩ් මෝටර්ස් ලංකා පුද්ගලික සමාගම වෙත 2023 ජුලි 26 දින ලංසුව ප්‍රදානය කර තිබුණි. ලංසු ප්‍රදාන ලිපිය අනුව අමතර කොටස් හා උපාංග 2023 සැප්තැම්බර් 23 දිනට පෙර සැපයිය යුතු වුවද විගණිත දින වූ 2023 දෙසැම්බර් 06 දින වන විටද රු. 10,429,226ක් වූ අමතර කොටස් හා උපාංග සපයා නොතිබුණි. | 2023 වසර අවසානය වන විටදී ද අමතර කොටස් හා උපාංග යම් ප්‍රමාණයක් භාර දී නොතිබුණි. එවකට රටේ පැවති ආර්ථික තත්ත්වය සහ භාණ්ඩ නැව් ගත කිරීම් ප්‍රමාද වීම් හේතුවෙන් අමතර කොටස් සැපයීම ප්‍රමාද වන බව සැපයුම්කාර ආයතනය දැනුම් දී ඇත. | මුදල් ගෙවීමට ප්‍රථම අමතර කොටස් හා උපාංග ලබාගත යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් සිට 2023 ජූලි දක්වා තැපැල් මූලස්ථානයේ රියදුරන් 81 කට මාස 08 කට රු. 13,653,606 ක් අතිකාල දීමනා ගෙවා තිබුණි. එම කිසිඳු අතිකාල වවුචරයක රියදුරු විසින් ධාවනය කළ වාහන අංකය සටහන් කර නොතිබුණු බැවින් මෙම | අදහස් දක්වා නොමැත | රියදුරන්ගේ අතිකාල වවුචර්වල වාහන අංකය සටහන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීමේ නිවැරදිභාවය විගණනයට පරීක්ෂා කළ නොහැකි විය | | |
| (ඇ) | අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන් 29දෙනා වෙත 2023 ජනවාරි 01දින සිට 2023 දෙසැම්බර් 31දින දක්වා කාලයට අදාළව රු 23,820,606 .ක මුළු වැටුප හා රු 6,963,794 . ගමන් වියදම් හා සංයුක්ත දීමනාව වශයෙන් මුළු පාරිශ්‍රමිකය රු 30,484,400 . ක් ගෙවා තිබුණද එම නිලධාරීන් නිකුත් කළ විගණන විමසුම් සංඛ්‍යාව සමඟ සසඳා බැලීමේදී ගෙවූ රු 30,484,400 .කට අදාළව ප්‍රමාණවත් විගණන පරීක්ෂාවන් සිදු කළේද යන්න විගණනයට ප්‍රශ්නගත විය. | 2019 පෙබරවාරි 05 දින විගණන සැලැස්ම පිළියෙල කිරීමේ දී ප්‍රමිත කරන ලද තැපැල් කාර්යාල විගණනය කිරීම සඳහා උපරිම කාලය හා විගණනය සඳහා සහභාගී වන නිලධාරීන් ගණන මත විගණන පැවරුම් සිදු කරන අතර ඒ මත උපරිම කාර්යක්ෂම තාවයකින් හා ඵලදායීව අදාළ විගණන කටයුතු හා ගිණුම් පරීක්ෂණ කටයුතු කර ඇති බව වාර්තා කරමි. 2023 වර්ෂයේ විගණන නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීමේ දී පහත පරිදි කාර්ය සාධනයක් අත් කරගෙන ඇති බව වාර්තා කරමි.<br>ඉටු කර ඇති විගණන හා ගිණුම් පරීක්ෂණ සංඛ්‍යාව 87, අයකර ගැනීමට වාර්තා කර ඇති ඌණතා වටිනාකමරු. 5,826,773, නිරීක්ෂණ ඉදිරිපත් කරන ලද ප්‍රධාන කරුණු 609, විශේෂ විමර්ශණයට යොමු කරන ලද විගණන නිරීක්ෂණ සංඛ්‍යාව 28 අභ්‍යයන්තර පාලනය නිවැරදි කර ගැනීමට ලබා දී ඇති උපදෙස් සංඛ්‍යාව 124, දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ ගැන්වීමට ඉදිරිපත් කර ඇති යෝජනා සංඛ්‍යාව 153 | ගෙවූ පාරිශ්‍රමිකයට ප්‍රමාණවත් පරිදි විගණන කටයුතු සිදු කළ යුතුය. |
| (ඈ) | තැපැල් ප්‍රවාහන අංශයේ සහ පාලක (විමර්ශන) අංශයේ සේවකයන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ඇඟිලි සළකුණු යන්ත්‍රයක් සවිකර නොතිබුණි. ඇඟිලි සළකුණු යන්ත්‍රයක් සවිකර නොතිබීම හේතුවෙන් අතිකාල ගෙවීම් පරීක්ෂාවට පදනම් කරගත හැකි වූ ප්‍රබල සාක්ෂියක් | අදහස් දක්වා නොමැත | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විගණනයට අහිමි වී තිබුණි. මේ හේතුවෙන් ගෙවා තිබුණු පිළිවෙලින් රු. 2,503,546 ක සහ රු. 1,880,898ක අතිකාල දීමනාවල නිවැරදිතාවය සම්බන්ධයෙන් බැහැර කළ නොහැකි සැකමුසුභාවයක් පවතින බව නිරීක්ෂණය විය. | | |
| (ඉ) | 1993 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් ප්‍රකාරව තැපැල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කාර්ය මණ්ඩලයට අයත් නොවන අභ්‍යන්තර විගණන අංශයේ සහ පාලක (විමර්ශන) අංශයේ සේවකයන් සඳහා 2023 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා පිළිවෙලින් රු. 1,250,677 ක සහ රු. 183,804 ක සෙනසුරාදා දීමනා ගෙවා තිබුණි. මෙම දීමනාව ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල් කාර්යාල කටයුතු සෑම සති අන්ත විවේක දින වන සෙනසුරාදා දින මෙහෙයුම් කටයුතු ඉටු කරනු ලබන අතර එදින විශාල ගනුදෙනු හා මූල්‍ය සංසරණයක් සිදු කරනු ලැබේ. එම ගනුදෙනු මුදල් හා මුදල් සමාන දෑ සම්බන්ධයෙන් හදිසි පරීක්ෂාව, විමර්ශණය, විගණනය හා සංනිරීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන්ට සෙනසුරාදා දීමනා ගෙවීම සඳහා 1993 සැප්තැම්බර් 08 දිනැති අමප/93/450/038 දරන අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබා දී ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | අංක KC – 5114 දරන මෝටර් රථය 2022 දෙසැම්බර් 17 දින සිට අධිකාරී, මධ්‍යම තැපැල් හුවමාරුවට රැගෙන ගොස් තිබුණි. එදිනට ආරම්භක මයිලෝ මීටරය 162179 ක් ලෙස සටහන්ව පැවතුණි. අවසන් මයිලෝ මීටරය 163078 ක් ලෙස සටහන් කර තිබුණු අතර කිලෝ මීටර් 900 ක් ධාවනය කළ බවට සටහන් කර තිබුණි. මෙම රථය 2023 ජනවාරි 24 දින කාර්මික අංශයට යොමුකර තිබුණු අතර ආරම්භක මයිලෝ මීටරය | එම තොරතුරු 2024 අප්‍රේල් 26 දින ඔබ වෙත එවා ඇති බව දන්වා සිටිමි | ධාවනය කළ කිලෝ මීටර් 900 ට අදාළ ගමන් පිළිබඳ විස්තර පැහැදිලිව විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 163078 ක් ලෙස සටහන් කර තිබුණි. මෙම රථය මෙම කාල සීමාව තුළ කිලෝ මීටර් 900 ක් කුමන ස්ථානවල ගමන් කළේද, වාහනය භාවිතා කළ නිලධාරීන් කවරහුද, රථය එක් එක් දිනවල ගමන් කළ දුර ප්‍රමාණයන්, භාවිතා කළ නිලධාරීන්ගේ අත්සන ආදී විස්තර පිළිබඳ පරීක්ෂා කිරීමට ධාවන සටහන්වල කිසිදු තොරතුරක් සටහන් කර නොතිබුණි. තවද මෙම රථයට මෙම කාලසීමාව තුළ යෙදවූ ඉන්ධන පිළිබඳ කිසිදු සටහනක් නොවීය. | | |
| (උ) | තැපැල් මූලස්ථානයේ සහ මධ්‍යම තැපැල් හුවමාරුවේ එක් ජෙනරේටරය බැගින් ජෙනරේටර් 02 ක් තිබුණු අතර 2023 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාසවල දින කීපයක් තුළදී තැපැල් මූලස්ථානයේ ජෙනරේටරය සඳහා ඩීසල් ලීටර් 1,200 ක්ද ,මධ්‍යම තැපැල් හුවමාරුවේ ජෙනරේටරය සඳහා ඩීසල් ලීටර් 1,000 ක්ද නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය විය. 2023 වර්ෂයේ විදුලි කප්පාදුවක් සිදු නොවූ කාලයක මෙසේ ඩීසල් ලබාගෙන තිබුණි. | අදහස් දක්වා නොමැත | අවශ්‍යතාවය පරිදි ඩීසල් මිලදී ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | දෙපාර්තමේන්තුව විසින් වාහන සඳහා ඉන්ධන නිකුත් කිරීම් ධාවන සටහන්වල ගමන් පිළිබඳ සටහන් පවත්වාගෙන යාම් කටයුතුවල අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පැවතුණු බව විගණනය විසින් පරීක්ෂා කළ අවස්ථා 05 කදී නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත | වාහන සඳහා ඉන්ධන නිකුත් කිරීමේ අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කළ යුතුය. |
| (එ) | 2023 දෙසැම්බර් 31 දිනට අවසන් නොවූ මූලික විමර්ශන, අවසන් නොවූ මු.රෙ. 104 පරීක්ෂණ සහ අවසන් නොවූ විධිමත් විනය පරීක්ෂණ යන තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එහි කාර්යසාධනය පරීක්ෂා කිරීමට නොහැකි විය. පාලක (විමර්ශන) වෙත වාචිකව, ලිඛිතව සහ සිහිකැඳවීම් 03 ක් මගින් තොරතුරු ඉල්ලූවද කිසිදු තොරතුරක් පාලක (විමර්ශන) විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | මූලික විමර්ශන, අවසන් නොවූ මු.රෙ. 104 පරීක්ෂණ සහ අවසන් නොවූ විධිමත් විනය පරීක්ෂණවලට අදාළ තොරතුරු නියමිත දිනවල විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඒ) | **නාරාහේන්පිට යාන්ත්‍රික ඉංජිනේරු අංශය** | | |
| i. | 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වර්ෂ 05 තුළ නාරාහේන්පිට යාන්ත්‍රික ඉංජිනේරු අංශයට පිළිවෙලින් අමතර කොටස් මිලදීගැනීමේ වියදම රු. 163,921,429 ක්ද, වැටුප රු. 103,476,902 ක්ද, අතිකාල රු. 37,303,888 ක්ද වශයෙන් එකතුව රු. 304,702,219 ක වියදමක් දරා තිබුණි. එම කාල පරිච්ඡේදය තුළ වාහන | අදහස් දක්වා නොමැත | 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අලුත්වැඩියා කළ වාහන පිළිබඳ විස්තර සහ යෙදූ අමතර කොටස් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කීයක් අලුත්වැඩියා කළේද, එක් එක් වාහනයට යෙදූ අමතර කොටස්, ටයර්, ටියුබ් හා බැටරිවල යනාදී තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණු අතර ඒ අනුව රු. 304,702,219 ක වියදමේ සාධාරණභාවය පිළිබඳ කිසිදු විගණන පරීක්ෂාවක් සිදු කළ නොහැකි විය. | | |
| ii. | 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අලුත්වැඩියා සඳහා යොමු කළ වාහනවල වැඩ ඇනවුම් පත්‍රිකා නිසි පරිදි ඉදිරිපත් කර නොතිබුණු අතර 2017 වර්ෂයට අදාළව වැඩ ඇනවුම් පත්‍රිකා 113 ක් අඩුවෙන්ද, 2018 වර්ෂයට අදාළව වැඩ ඇනවුම් පත්‍රිකා 954 ක් අඩුවෙන්ද, 2019 වර්ෂයට අදාළව වැඩ ඇනවුම් පත්‍රිකා 354 ක් අඩුවෙන්ද, 2021 වර්ෂයට අදාළව වැඩ ඇනවුම් පත්‍රිකා 851 ක් අඩුවෙන්ද, 2022 වර්ෂයට අදාළව වැඩ ඇනවුම් පත්‍රිකා 993 ක් අඩුවෙන්ද සහ 2023 වර්ෂයට අදාළව වැඩ ඇනවුම් පත්‍රිකා 383 ක් අඩුවෙන්ද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර 2020 වර්ෂයේ කිසිදු වැඩ ඇනවුම් පත්‍රිකාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | වැඩ ඇනවුම් පත්‍රිකා හිඟයක් නොමැතිව විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| iii. | වැඩ ඇනවුම් පත්‍රිකාවල වාහනවලට යෙදූ අමතර කොටස් හඳුනාගත හැකිවන ආකාරයෙන් සටහන් කර නොතිබීම, ලොග් පොත්වල යෙදූ අමතර කොටස් | අදහස් දක්වා නොමැත | වාහනයේ අංකයද සමඟ යෙදූ අමතර කොටස් හඳුනාගත හැකිවන ආකාරයෙන් පරිගණකගත කළ ඉන්වෙන්ට්‍රි |

| | | | |
|---|---|---|---|
| | අපැහැදිලිව සටහන් කිරීම, පරිගණකගත කරන ලද ඉන්වෙන්ට්‍රියක් නඩත්තු කර නොතිබීම සහ අතින් ලියන ලද ඉන්වෙන්ට්‍රියද පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයෙන් නඩත්තු නොකිරීම හේතුවෙන් යෙදූ අමතර කොටස් පිළිබඳ විගණන පරීක්ෂාවක් සිදු කළ නොහැකි විය. | | ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| iv. | නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2022 හා 2023 වර්ෂවල රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ආනයනය තහනම් වූ විශාල වටිනාකම් සහිත නියම අමතර කොටස්වල ආරක්ෂාව පිළිබඳව විගණනයට ප්‍රශ්නගත විය. | අදහස් දක්වා නොමැත | වාහන අමතර කොටස් ආරක්ෂා කර ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| v. | 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු. 304,702,219 ක වියදමක් දරා නාරාහේන්පිට යාන්ත්‍රික ඉංජිනේරු අංශයක් පවත්වා තිබියදී වාහන 183 ක් බාහිර ගරාජවලින් අලුත්වැඩියා කිරීමට රු. 32,198,480 ක වියදමක් දරා තිබුණි. | අදහස් දක්වා නොමැත | නාරාහේන්පිට යාන්ත්‍රික ඉංජිනේරු අංශයක් තිබියදී බාහිර ගරාජවලින් වාහන අලුත්වැඩියා කිරීමට හේතු සොයා බැලිය යුතුය. |
| vi. | විගණිත දින වූ 2023 නොවැම්බර් 16 දින වන විට වැඩ අවසන් නොකළ වැඩ ඇනවුම් 40 ක් යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ තිබුණු අතර ඉන් 23 ක කාල පරාසය මාස 03සිට වර්ෂ 06 ක් දක්වා විහිදී තිබුණි. | අදහස් දක්වා නොමැත | ප්‍රමාදයකින් තොරව වාහන අලුත්වැඩියා කළ යුතුය. |
| vii. | 2023 නොවැම්බර් 16 දින සිදු කළ නාරාහේන්පිට යාන්ත්‍රික ඉංජිනේරු අංශය භෞතික පරීක්ෂාවේදී අලුත්වැඩියා කිරීම සඳහා | අදහස් දක්වා නොමැත | වැඩ ඇනවුම් පත්‍ර විගණනය වෙත නිසි පරිදි ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ස්ථානගත කර තිබුණු පහත වාහන 17 ක් සඳහා වැඩ ඇනවුම් පත්‍ර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | |
| viii. | 2023 නොවැම්බර් 16 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී අංක 57 - 5226 දරන වාහනය අලුත්වැඩියා කිරිම සඳහා යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ ස්ථානගත කර තිබුණු බව නිරීක්ෂණය වුවද එම වාහනය දෙපාර්තමේන්තුවේ වාහනයක් නොවන බව විගණනය වෙත ඉදිරිපත් කළ දෙපාර්තමේන්තුව සතු වාහන ලේඛනය අනුව තහවුරු විය. | අදහස් දක්වා නොමැත | දෙපාර්තමේන්තුවට අයත් වාහන පමණක් යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් අලුත්වැඩියා කළ යුතුය. |
| ix. | යාන්ත්‍රික ඉංජිනේරු අංශය තුළ වාහන දිරාපත් වෙමින් පවතින බවත් සමහර වාහනවල බඳ කොටස පමණක් තිබුණි. එම වාහනවල ඇතුළත් කොටස් සහ ආසන ඉවත් කර තිබුණි. ඉවත් කළ අමතර කොටස් හඳුනා ගැනීම සඳහා වෙන වෙනම ගබඩා කර නොතිබුණි. රජයේ දේපළ අරපරිස්සමින් භාවිතා කළ යුතු වුවත් එසේ කර නොතිබුණි .මෙම වාහනවල අමතර කොටස්වල ආරක්ෂාව විගණනයට ප්‍රශ්නගත විය. | අදහස් දක්වා නොමැත | රජයේ දේපළ අරපිරිමැස්මෙන් භාවිතා කළ යුතුය. |
| x. | නාරාහේන්පිට යාන්ත්‍රික ඉංජිනේරු අංශය විසින් දෙපාර්තමේන්තුව සතු නොවන වාහන 06 ක් අවස්ථා 07 කදී අලුත්වැඩියා කර තිබුණු බව විගණනය වෙත ඉදිරිපත් කළ දෙපාර්තමේන්තුව සතු වාහන ලේඛනය අනුව | අදහස් දක්වා නොමැත | දෙපාර්තමේන්තුවට අයත් වාහන පමණක් යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් අලුත්වැඩියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිරීක්ෂණය විය .මේ සඳහා දැරූ වියදම් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අය කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එසේ සිදුකර නොතිබුණි. | | |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තැපැල් දෙපාර්තමේන්තුව සඳහා සකස් කර තිබුණු නිල වෙබ් අඩවිය පරීක්ෂාවේදී එම වෙඩ් අඩවියේ මහජනයාගේ අවශ්‍යතාවයන්, දෙපාර්තමේන්තුව පිළිබඳ චෝදනා හෝ ප්‍රශංසා පල කිරීමට අවශ්‍ය පහසුකම් සලසා නොතිබුණු විගණනයට බව නිරීක්ෂණය විය. | යාවත්කාලීනව පවත්වාගන යන වෙබ් අඩවියක් ඇති බවත්, එහි පිවිසුම් දොරටුව URL : https//:slpost.gov.lk බවත්, මහජන අවශ්‍යතා සඳහා සියළු තොරතුරු වෙබ් අඩවිය තුල ඇති බවත්, චෝදනා හෝ ප්‍රශංසා පල කිරීමට පහසුකම් සළසා ඇති බවත්, දන්වමි. | අවශ්‍ය පහසුකම්වලින් යුක්තව නිල වෙබ් අඩවිය සකස් කළ යුතුය. |
| (ආ) | තැපැල් දෙපාර්තමේන්තුව විසින් තොරතුරු දැනගැනීමේ කාර්යය සඳහා නිලධාරියෙකු පත්කර තිබුණද එම නිලධාරිනිය සතුව දෙපාර්තමේන්තුව සතු අත්‍යාවශය තොරතුරු නොතිබුණු බව විගණනයට නිරීක්ෂණය විය. දිවයින පුරා පිහිටි නියෝජ්‍ය තැපැල්පති කාර්යාලවල නියෝජ්‍ය තැපැල්පතිවරු පිළිබඳ විස්තර, දිසා පාලන කාර්යාලවල දිසා ගණකාධිකාරීවරු පිළිබඳ විස්තර, දිසා ගිණුම් කාර්යාලවල දිසා ගණකාධිකාරීවරුන් පිළිබඳ විස්තර, ප්‍රාදේශීය තැපැල් අධිකාරී කාර්යාලවල ප්‍රාදේශීය තැපැල් අධිකාරීවරුන් පිළිබඳ විස්තර උදාහරණ ලෙස දැක්විය හැකිය. | තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 23 (2) වගන්තිය ප්‍රකාරව තම පොදු අධිකාරිය වෙත ඉදිරිපත් වන තොරතුරු ඉල්ලීම් සඳහා තොරතුරු ලබාදීම හා එවැනි තොරතුරක් ලබා ගැනීම සඳහා පුරවැසියාට අවශ්‍ය සියළු සහාය ලබා ගැනීම තොරතුරු නිළධාරියාගේ මගින් ලබාදෙන අතර විගණන විමසුමේ සඳහන් කරන ලද කරුණට අදාළව තොරතුරු තැපැල් මූලස්ථානයේ පාලන අංශය මගින් ලබා ගත යුතු බව කාරුණිකව දන්වා සිටිමි. | තැපැල් දෙපාර්තමේන්තුවේ සියලු තොරතුරු තොරතුරු දැනගැනීමේ නිලධාරියා සතුව තිබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මහජනයාගේ සේවා ඉටු කිරීම සඳහා මහජන පැමිණිලි ලේඛනයක් නඩත්තු කර නොතිබුණු අතර ඒ වෙනුවට 2017 සිට 2022 වර්ෂය දක්වා ලැබුණු පැමිණිලි ලෙස සඳහන් කළ ලිපි කිහිපයක් විගණනයට ඉදිරිපත් කර තිබුණි. | මහජනයා වෙතින් කරනු ලබන පැමිණිලි භාර ගැනීම ලේඛනගත කිරීම හා එම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග දැක්වෙන ලේඛනයක් පවත්වාගෙන යාම සිදු නොවන අතර මහජනයා පැමිණිලි හා තොරතුරු විමසීම සඳහා 1950 දුරකථන අංකයක්ද මෙම දෙපාර්තමේන්තුවෙන් හඳුන්වාදී ඇති බවත් දන්වා සිටිමි. | මහජන පැමිණිලි ලේඛනයක් නඩත්තු කළ යුතුය. |
| (ඈ) | තොරතුරු දැන ගැනීමේ පනත ප්‍රකාරව මහජනයා / වෙනත් ඉල්ලුම්කාර පාර්ශවයන් විසින් ඉල්ලන තොරතුරු, ඒවා ලබාදීම හා ලබා නොදීමට හේතු ඇතුළත් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | තොරතුරු දැනගැනීමේ පනත ප්‍රකාරව මහජනයා වෙනත් පාර්ශවයන් විසින් ඉල්ලන තොරතුරු ලියාපදිංචි කිරීම සඳහා RTI 03 ලේඛනයක්ද එලෙස කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමේදී ලේඛන ගත කිරීම සඳහා RTI 11 ලේඛනයක්ද පවත්වාගෙන යනු ලබයි. | තොරතුරු දැන ගැනීමේ පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | මහජනයා විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගැනීම, ලේඛනගත කිරීම, එම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග දැක්වෙන ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් හෝ නොතිබුණි. | මහජනයා වෙතින් කරනු ලබන පැමිණිලි භාර ගැනීම ලේඛනගත කිරීම හා එම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග දැක්වෙන ලේඛනයක් පවත්වාගෙන යාමක් සිදු නොවන අතර මහජනයාට පැමිණිලි කිරීමට තොරතුරු විමසීමට 1950 දුරකථන අංකයක් මෙම දෙපාර්තමේන්තුවෙන් හඳුන්වාදී ඇති බවත් දන්වා සිටිමි. | මහජන පැමිණිලි ලේඛනය යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුගත නියෝජ්‍ය තැපැල්පති තනතුර සඳහා භාණ්ඩාගාරය විසින් අනුමත කළ සේවක සංඛ්‍යාව 09 ක් වුවද තත්‍ය කාර්යය මණ්ඩලය 11 ක් වූයෙන් අනුමත කළ සේවක සංඛ්‍යාව ඉක්මවා නියෝජ්‍ය තැපැල්පති තනතුරු 02 ක් සඳහා බඳවාගෙන තිබුණි. | තැපැල් දෙපාර්තමේන්තුවේ අනුමත නියෝජ්‍ය තැපැල්පති තනතුරු සංඛ්‍යාව 13 ක් වන අතර ඉන් 04 ක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු මඟින් පිරවීම සිදු කෙරේ. ඒ අනුව දෙපාර්තමේන්තු ගත තනතුරු 09 ක් වේ. දෙපාර්තමේන්තුව තුලින් නියෝජ්‍ය තැපැල්පතිවරුන්ට උසස්වීම ලබා දෙනු ලබන්නේ විධායක 11 ශ්‍රේණියේ අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව සකස් කරන | භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ සේවක සංඛ්‍යාව අනුව බඳවාගැනීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාණ්ඩාගාරයෙන් අනුමත කළ නියෝජ්‍ය තැපැල්පති තනතුර 2020 ජනවාරි 09 දින වන විට සම්පූර්ණ වී තිබියදී කිසිදු අනුමැතියක් ලබා නොගෙන 2021 දෙසැම්බර් 11 සහ 2022 අප්‍රේල් 27 දිනවල දෙපාර්තමේන්තුගත නියෝජ්‍ය තැපැල්පති තනතුරුවලට නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි. | ලද බඳවා ගැනීම් පටිපාටි ප්‍රකාරව ශ්‍රේණි උසස්වීමේ ක්‍රමවේදය මත නියෝජ්‍ය තැපැල්පති තනතුර සඳහා නිලධාරීන් 02 නෙක් සුදුසුකම් ලබා තිබුණි. පුරප්පාඩු වූ තනතුරු 02ක් සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු වලට සුදුසුකම් ලත් නිලධාරීන් අයදුම් නොකල බැවින් එම තනතුරු 02 සඳහා දෙපාර්තමේන්තුවේ සුදුසුකම් ලත් නිලධාරීන් යෙදවීමට සිදු විය. ඒ අනුව තනතුර සංඛ්‍යාව 11 ක් වී ඇති බව පෙන්වා දෙමි. | |
| (ආ) | දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 27,372 ක් වුවද තත්‍ය සේවක සංඛ්‍යාව 21,459 ක් විය. ඒ අනුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව 5,913 ක් විය. 2023 දෙසැම්බර් 31 දිනට අනෙකුත් ශ්‍රේණි හා සේවා වල 3,660 ක හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවාවල 63 ක පුරප්පාඩු පැවතුණි. එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අපොහොසත් වී තිබුණි. | තැපැල් සේවා නිලධාරි තනතුර සඳහා සීමිත පදනමින් 415 ක් බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇත. එහි පළමු අදියර යටතේ සුදුසුකම් ලත් 218 දෙනෙකු බඳවා ගැනීම සිදු කරන ලදී. ඉතිරි සංඛ්‍යාව බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එමෙන්ම සහකාර තැපැල් අධිකාරි (ප්‍රධාන තැපැල් කාර්යාල) තනතුර සඳහා 38 දෙනෙකු බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණය සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය අනුව සහකාර තැපැල් අධිකාරි තනතුරු ප්‍රමාණය 106 කින් වැඩිකිරීමට ලබා දුන් අනුමැතිය මත අදාළ බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය සිදු කර ඇත. සීමිත පදනම මත සහකාර තැපැල් අධිකාරි (ගිණුම් පරීක්ෂණ) හා සහකාර තැපැල් අධිකාරි (විමර්ශන) තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ සේවක සංඛ්‍යාව සංශෝධනය කළ යුතුය. |